# 多言語情報コーナー　（令和８年　５月号）

## 1. බදු ගෙවීම් නිවේදන පත්‍රිකා නිකුත් කිරීම පිලිබඳව

මැයි මාසය යනු බදු ගෙවීම් සඳහා කාර්යබහුල මාසයකි. පළමුව,සාමාන්‍ය මෝටර් රථ බදු සහ සැහැල්ලු මෝටර් රථ වාහන බදු වේ. තොචිගි ප්‍රාන්ත කාර්යාලය මගින් මැයි මස 1 වන දින සාමාන්‍ය මෝටර් රථ සඳහා "බදු ගෙවීම් පත්‍රිකා" යවනු ලබන අතර, තොචිගි නගර ශාලා කාර්යාලය මගින් මැයි මස 14 වන දින සැහැල්ලු මෝටර් රථ සඳහා "බදු ගෙවීම් පත්‍රිකා "සාමාන්‍ය සහ සැහැල්ලු මෝටර් රථ හිමිකරුවන් වෙත යවනු ලැබේ.

මෙම දැනුම් දීමේ පත්‍රිකාව මගින් ඔබ කොපමණ බදු මුදලක් ගෙවිය යුතුද සහ කවදා වනවිට ගෙවිය යුතුද යන්න සඳහන් වේ.

ගෙවීමේ අවසාන දිනය ජුනි මස1 වන දින වන බැවින් කරුණාකර අවසාන දිනයට පෙර ගෙවීමට වග බලා ගන්න.

සාමාන්‍ය මෝටර් රථ බදු සහ සැහැල්ලු වාහන බද්ද බැංකු,කොම්බිනි වෙළඳසැල් මගින් ද PayPay සහ ක්‍රෙඩිට් කාඩ් මගින් ස්මාර්ට්ෆෝන් ගෙවීම් යෙදුම් භාවිතා කරමින් ගෙවිය හැකිය.

නැවත, දේපල බදු සහ නගර සැලසුම් බද්ද ඇත. තොචිගි නගර ශාලාව මගින් මැයි මස 15 වන දින නිවාස හෝ ඉඩම් හිමියන් වෙත දේපල බදු සහ නගර සැලසුම් "බදු ගෙවීම් පත්‍රිකා" යවනු ඇත.

ඔබට මෙම දැනුම් දීමේ පත්‍රිකාව ලැබුණු පසු, කරුණාකර ඔබ කොපමණ මුදලක් ගෙවිය යුතුද සහ කවදා වනවිට ගෙවිය යුතුද යන්න පරීක්ෂා කරන්න. ඔබට සම්පූර්ණ මුදල එකවර ගෙවිය හැකි අතර, නැතහොත් එය වාරික හතරක් ලෙසද ගෙවිය හැකිය. ඔබ සම්පූර්ණ මුදල එකවර හෝ වාරික හතරකින් ගෙවුවද, පළමු වාරිකය ගෙවිය යුතු අවසාන දිනය ජුනි මස 1 වැනිදා වේ.

ඔබට කිසියම් අපැහැදිලි බවක් ඇත්නම් , කරුණාකර නගර ශාලාවේ දේපල බදු දෙපාර්තමේන්තුව අමතන්න.

## 2. මයි නම්බර් කාඩ්පතක් අලුතින් සාදාගැනීම හෝ කාඩ්පත අලුත් කිරීම් සම්බන්දව

ඔබ තොචිගි නගරයේ පදිංචිකරුවෙකු ලෙස ලියාපදිංචි වී අලුතින් මයි නම්බර් කාඩ්පතක් සඳහා අයදුම් කරන්නේ නම් හෝ ඔබගේ පවතින කාඩ්පත අලුත් කරන්නේ නම්, ඔබට නගර ශාලාවට යාමෙන් තොරව නගරයේ ඇති තැපැල් කාර්යාල 29 න් ඕනෑම එකක් මගින් ඉල්ලුම් පත්‍රිකාවක් නොමැතිව මයි නම්බර් කාඩ්පතක් සඳහා ඉල්ලුම් කළ හැකිය. ඔබට

එසේම, ඔබට මයි නම්බර් කාඩ්පතක් තිබේ නම්, ඔබට ඔබේ ස්මාර්ට් ජංගම දුරකථනය හෝ පරිගණකය භාවිතයෙන් ද අයදුම් කළ හැකිය.

කෙසේ වෙතත්, කරුණාකර පහත සඳහන් කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

※ තැපැල් කාර්යාලය මගින් අයදුම් කිරීමේදී , ඔබ විසින් අදාල තැපැල් කාර්යාලය අමතා දිනයක් සහ වේලාවක් වෙන් කරවා ගත යුතුය.

※ ඔබ අයදුම් කර මසකින් පමණ පසු ඔබට ලැබෙන "නිකුත් කිරීමේ දැනුම්දීම්" පත්‍රිකාව රැගෙන ප්‍රධාන නගර ශාලාවේ පුරවැසි ජීවිත අංශයට හෝ සෑම ශාඛා කාර්යාලයකම ප්‍රජා සංවර්ධන ප්‍රවර්ධන අංශයට පැමිණ ලබාගත හැක.

※ ඔබගේ මයි නම්බර් කාඩ්පතේ විද්‍යුත් සහතිකය අලුත් කිරීම තැපැල් කාර්යාලයකදී කළ නොහැක.

※ මයි නම්බර් කාඩ්පත රියදුරු බලපත්‍රය හා සම්බනන්ධ කිරීම තැපැල් කාර්යාලයකදී කළ නොහැක.

**3. පාපැදි රථවාහන උල්ලංඝනය කිරීමේ දැනුම්දීමේ පද්ධතිය ("නිල් ටිකට්පත") පිලිබඳව**

මෙය බහුභාෂා තොරතුරු ඒකකයේ මාර්තු මස කලාපයේ තොරතුරු නැවත ඉදිරිපත් කිරීමකි. මෙය පාපැදිකරුවන් සඳහා ඉතා වැදගත් වන තොරතුරු වේ.

2026 අප්‍රේල් 1 වන දින සිට, "නිල් ටිකට්පත" ලෙසද හැඳින්වෙන "රථවාහන උල්ලංඝනය කිරීමේ දැනුම්දීමේ පද්ධතිය"මගින් පාපැදි රථවාහන උල්ලංඝනය කිරීම් සඳහා හඳුන්වා දෙන ලදී.

රථවාහන උල්ලංඝනය කරන පාපැදි කරුවන් හට පොලිස් නිලධාරියෙකු විසින් "නිල් ටිකට්පතක්" නිකුත් කරනු ලබන අතර, එය උල්ලංඝනය කරන ලද කරුණු පිළිබඳ විස්තර කරන අතර, දඩය ගෙවීම සඳහා බැංකුවකට හෝ තැපැල් කාර්යාලයකට ගෙන යාම සඳහා "ගෙවීම් පත්‍රිකාවක්" නිකුත් කරනු ලැබේ.

අදාල දඩමුදල එම ස්ථානයේදී මුදල් මගින් එම එම ස්ථානයේ සිටින පොලිස් නිලධාරියා වෙත ගෙවීමක් සිදුකල නොහැක.

ප්‍රතිපත්තිමය වශයෙන්, මෙම නීතිමය බැදීම (දඩය ලැබීම)සිදුවූ පසුදින සිට දින හතක් ඇතුළත මෙම දඩය ගෙවිය ගෙවිය යුතුය.මෙම තාවකාලික දඩ පත්‍රිකාව බැංකුවකට හෝ තැපැල් කාර්යාලයකට ගොස් ගෙවීමේ ක්‍රියා පටිපාටිය කරි නෝඵු ලෙස හඳුන්වනු ලැබේ.
ඔබ ඉහත සඳහන් දඩ ගෙවීමේ ක්‍රියාවලිය සිදු නොකරන්නේ නම් , අපරාධ නඩු විභාගයකට යොමු වන අතර ඔබ වැරදිකරු වනු ඇත.

නිල් ටිකට් ක්‍රමය වයස අවුරුදු 16 සහ ඊට වැඩි පාපැදිකරුවන් සඳහා අදාළ වේ.
රථවාහන උල්ලංඝනය කිරීම් සඳහා වන ප්‍රධාන දඩ මුදල් අතරට බයිසිකලයක් පදින අතරතුර තිරය දෙස බලා සිටිමින් ස්මාර්ට් ජංගම දුරකථනයකින් කතා කිරීම සඳහා යෙන් 12,00 ක්ද ,මාර්ග සංඥා නොපිලිපැදීම සඳහා යෙන් 6,000 ක්ද , කුඩයක් අතැතිව පාපැදිය ධාවනය කිරීම , ඉයර්ෆෝන් පැළඳ ධාවනය කිරීම, නවත්වා ගමන්කලයුතු ස්ථානවල නොනවත්වා ධාවනය කිරීම , දකුණු පසින් ගමන් කිරීම සහ විදුලි පහන් නොමැතිව ධාවනය කිරීම සඳහා යෙන් 5,000 ක් සහ පේලි දෙකක් ලෙස ධාවනය කිරීම සඳහා යෙන් 3,000 ක් ලෙස දඩ මුදල්

ගෙවිය යුතුය.

මේවා රථවාහන අනතුරු වැළැක්වීම සඳහා වන නීති වේ. එමනිසා රථවාහන නීති අනුගමනය කිරීමට වග බලා ගනිමු.